මානව හිමිකම්, ජනමාධ්‍ය සහ ත්‍රස්තවාදය

රටක යුද්ධයක් පවතින විට මානව හිමිකම් සහ ජනමාධ්‍ය නිදහස අඩියක් පසු පසට ගත යුතු ද? රට පළමුව, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස දෙවනුව යන උද්යෝග පාඨය අද ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු පිලිවෙත ද?

ආණ්ඩුව කියන කතාව

පසුගිය දෙසැම්බර් 07 දා ජාතිය අමතා කළ කතාවෙහි දී ජනාධිපතිවරයා මෙසේ කීය:

මේ අවස්ථාවේ දී මා ඔබෙන් ඉල්ලීමක් කිරීමට කැමැති යි. ඔබ සිටින්නේ අතලොස්සක් ත්‍රස්තවාදීන් සමගද බහුතරය වන මහා ජනයා සමග ද කියා තීරණය කරන්න. ඔබ පැහැදිලිව මෙය තීරණය කළ යුතු ය. කිසිවකුට එකම අවස්ථාවේ දී මෙම දෙපාර්ශවය ම නියෝජනය කළ නොහැකි ය. (මෙහිදී බහුතර මහා ජනයා යනුවෙන් අදහස් කැරෙන්නේ ආණ්ඩුවේ මතවාදය යි. ඉන් කියැවෙන්නේ ජනමාධ්‍ය ආණ්ඩුව සහ එල්ටීටීඊ ය අතරින් එක් පාර්ශවයක් තෝරා ගත යුතු බව ය.)

පෙබරවාරි 23 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මෙසේ කීය:

දැන් රාජපක්ෂ ආණ්ඩුව අපේ භූමියෙන් ත්‍රස්තවාදය අතුගා දැමීමට සහමුලින්ම වැඩට බැස ඇති විට මානව හිමිකම්, මාධ්‍ය නිදහස, පැහැර ගැනීම්, අතුරු දහන්වීම්, පිලිබඳ එදා සිටි වීරයන්ම ඔවුන්ගේ සෙල්ලම ජනමාධ්‍ය සහ විදී උද්ඝෝෂන හරහා අරඹා තිබේ. (එදා සිටි වීරයන් අතර එක් අයකු වූ මහින්ද රාජපක්ෂ අද ජනාධිපති ය)

මෙයට පෙර මෙම තීරුවෙහිම සාකච්ජා කරන ලද *නීතියට පිටින් හෝ සාම සහ මානව හිමිකම් ජනමාධ්‍යකරුවන් විනාශ කළ යුතු බවට* අමාත්‍ය චම්පික රණවක කළ ප්‍රකාශය ද *ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ද ඊශ්‍රායලයේ ජනමාධ්‍ය මෙන් ආණ්ඩුවේ යුද්ධ ඒවායේ හරි වැරුද්ද නොසළකා සහමුලින්ම ආරක්ෂා කළ යුතු බවට* ආරක්ෂ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල කළ ප්‍රකාශය ද මෙයට එක් කළ යුතු ය. ඊටත් වඩා රාජ්‍ය මාධ්‍යයේ ඒක පාක්ෂික හැසිරීම ආණ්ඩුව පිළි ගන්නා ජනමාධ්‍ය පිළිවෙතට හොඳම කැඩපත ලෙම සළකා ගත හැකි ය.

එවිට අපට පෙනෙන්නේ අද ආණ්ඩුවේ පිළිවෙත වන්නේ ආණ්ඩුවේ යුද්ධයට සහාය දීම ජනමාධ්‍යයේ පළමු මූලිකත්වය විය යුතු අතර මාධ්‍ය නිදහස හ මානවහිමිකම් එයට දෙවැනිව සැළකිය යුතු බව ය. එම අදහස් පිළි නොගන්නා සියළුදෙනා හංංවඩු ගැසෙන්නේ ජාති ද්‍රෝහීන් ලෙස ය.

මහින්ද රාජපක්ෂ මහතාට ඇත්තේ මෙම මිනුම්දණ්ඩ අනුව අංක එකේ ජාති ද්‍රෝහියකු ලෙස සැළකිය හැකි ඉතිහාසයක් වීම වෙනම කතාවකි. එම මහින්ද රාජපක්ෂ ඉතිහාසය විසින් මෙම තර්කය යවන්නේ කණු කූඩයට නමුත් මෙම තර්කය ප්‍රජාතන්තවාදි මූලධර්ම සහ භාවිතයන් හරහා විමසා බැලිම වඩා වැදගත් ය.

මේ ආණ්ඩුවේ ප්‍රචාරකයන්ට අනුව මෙයට පෙර බලයේ සිටි කිසිදු ආණ්ඩුවක් මෙලෙස එල්ටීටීඊ ය අතු ගා දැමීමට කටයුතු කර නැත. ආණ්ඩුවට අනුව එබැවින් අද කළ යුතු මූලික සටන ඇත්තේ ත්‍රස්තවාදය සමඟ ය.

එදා යුද්ධ අනාවැකි

මෑත ඉතිහාසය දෙස මදක් එබී බලමු. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ සිට චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය දක්වාම යුද්ධය ජය දිනා අවසන් කිරීමට මේ ආණ්ඩුව මෙන්ම දින වකවානු දැක්වූහ. නිදසුනක් දක්වන්නේ නම් ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ කීවේ යුද්ධයෙන් සියයට 85ක්ම අවසන් බව යි. එමෙන්ම ජනාධිපති ප්‍රේමදාස යටතේ නැගෙනහිර අල්ලා ගැනීමේ මහා යුද මෙහෙයුමක් ද ජනාධිපතිනි චන්ද්‍රිකා යටතේ යාපනය අල්ලා ගැනීම සහ මාන්කුළම් දක්වා ඒ 9 පාර අල්ලා ගැනීම ද සිදුවිය. ජේ..ආර්. 1981 දෙසැම්බර් 31 දාට පෙර ත්‍රස්තවාදය තුරන් කිරීමට ශපථ කළේ ය. වත්මන් ආණ්ඩුව අප්‍රේල් අලුත් අවුරුද්දට පෙර නැගෙනහිර සහමුලින්ම අල්ලා ගැනීමට දින වකවානු දී තිබේ. එදා රජයේ ජනමාධ්‍ය විමසා බැලුවහොත් ඔබට පෙනී යනු ඇත්තේ අද පවතින රණඝෝෂා මෙන්ම ජයග්‍රහණයේ ප්‍රීති ඝෝෂා ද එදා පැවැති බව යි.

පැවැති අනෙක් ආණ්ඩුවල යුද්ද අනාවැකි විමසා බැලීමට ජනමාධ්‍යට අයිතියක් තිබුණි. විපක්ෂ දේශපාලනඥයෝ ද එසේ කළහ. එකල සිදු වූ මහා පරිමාණ අවි ජාවාරම් හෙළිදරව් කිරීමට ද අයිතියක් තිබුණි. පසුව යුද හමුදා සෙන්පතීන් දෙදෙනෙකුට ම එරෙහිව අල්ලස් දූෂන නඩු දෙකක් ද පවරනු ලැබුයේ ද ආණ්ඩුව ම විසිනි. කල් තබා එම දූෂන හෙළි දරව් කිරීමට ජනමාධ්‍යට අයිතියක් තිබුනේය යනු ඉන් ගම්‍ය නොවන්නේ ද? අද ජන මාධ්‍ය කට පියාගෙන සිටිය යුතු නම් යුද අවි ජාවාරම් නොවන බවට ආණ්ඩුවට දිය හැකි සහතිකය කුමක් ද?

දැන ප්‍රශ්නය මෙය යි. ප්‍රථමයෙන් වත්මන් ආණ්ඩුවේ මතය සහ සැළසුම් විවේචනය කිරීමට ජනමාධ්‍යට අයිතියක් ඇත් ද? විවේචන කිරීමෙන් නොනැවතී වෙනත් අදහසක් මත ස්වකීය ජනමාධ්‍ය පවත්වා ගෙන යෑමට ජනමාධ්‍ය නිදහස මගින් ඉඩ සළසන්නේ ද? එල්ටීටීඊ සංවිධානය හෝ අනෙක් සන්නද්ධ සංවිධානයක් හෝ කියන්නේ කුමක් දැයි දැන ගැනීමට මෙරට ජනයාට අයිතියක් එනම් ජනමාධ්‍යට ඒවා වාර්තා කිරීමට අයිතියක් තිබිය යුතු ද?

ජනමාධ්‍යයේ තෙවැනි අවකාශය

ජනමාධ්‍ය සඳහා එල්ටීටීඊත් නොවන ආණ්ඩුවත් නොවන තෙවැනි අවකාශයක් තිබේ. වෘත්තීමය ජනමාධ්‍ය ස්වාධීන නිරීක්ෂකයෙකු විනා පෙරහැරේ හේවිසිකරුවකු නොවේ. ජනමාධ්‍යට දෙපැත්තෙන් එක් පැත්තක් තෝරා ගන්නැයි කියන තර්කය වැරදි වන්නේ ඒ නිසා ය. අනෙක් අතට රටෙහි ඇත්තේ ආණ්ඩුව සහ එල්ටීටීය පමණක් ද නොවේ.

නිදසුනක් වශයෙන් නැගෙනහිර යුද්ධය බොරුවක් යැයි ජවිපෙ යළි යළි කියා සිටියහ. කොළඹ මාර්ග සෝදිසි ඇත් කරන්නෙ සිය රුස්වීම් කඩා කප්පල් කිරීමට යැයි ද කීහ. කටුනායක ගුවන් හමුදා කඳවුරට එල්ටීටීඊ අහසින් බෝම්බ දැමීම ගැන සහ රේඩාර් පද්දති ගැන ආණ්ඩුව, එජාපය, සහ ඉන්දියාව කියන්නේ වෙන වෙන කතා ය. එබැවින්

සිදුවීම් ගැන ඇත්තේ එක කතාවක් බවත් එය ආණ්ඩුවේ කතාව බවත් කීම අමූලික බොරුවකි. ජනමාධ්‍යට කතාවක හැම පැත්තම කීමට අයිතිය තිබිය යුත්තේ එනිසා ය.

පසුගිය වසර 25 පුරාම නිතිපතා යුද්ධයේ මානව හිමිකම් කෙළෙසීම් වාර්තා කරන මානව හිමිකම් පිළබඳ යාපනයේ විශ්ව විද්‍යාල ආචාර්‍යවරු. නම් එකතුව ගන්න. ඔව්හු ආණ්ඩුව ද එල්ටීටීඊ ය ද එකසේ විවේචනය කරති. ඇත්තේ දෙපැත්තක් පමණක් නම් එම වාර්තා පවතින අවකාශය කුමක් ද? පැහැදිලිවම තෙවැනි අවකාශයකි.

සිදුවීමක සෑම පැත්තකම වාර්තා කිරීමේ සිය වගකීම යුද්ධයක් පවතින්නේ යැයි අත්හැර දැමිය නොහැකි ය. මහා ජනයාගෙන් සත්‍ය වසන් කිරීම ජනමාධ්‍යන් හි නොව ප්‍රචාරක යන්ත්‍රයන් හි කාර්‍ය බාරය යි. මහා ජනයා පමණක් නොව දේශපාලඥයින් පවා ආණ්ඩුකරනයේ මෙන්ම යුද්ධයේ ද සැබෑ තත්ත්වය දැන ගනු ඇත්තේ එවැනි ජන මාධ්‍යයක් පවතින්නේ නම් පමණි.

මුරපල්ලා බැඳ දැමීම

යුද්ධයක් පවතින නිසා ජනමාධ්‍යයේ මුර පල්ලාගේ කාර්ය ය අහෝසි වන්නේ නැත. මුර පල්ලාගේ කාර්‍ය ය ආණ්ඩුකරණය අරභයා පමණක් නොව යුද්ධ දේශපාලන ක්ෂේත්‍රයන් අරභයා ද පවතිය යුතු ය. යුද්ධයක යෙදී සිටින නිසා ආණ්ඩුවක් කරන සියලුම දේ එලෙසම වර්ණනා කිරීමට ජනමාධ්‍ය බැඳී නැත. ජනමාධ්‍ය ආණ්ඩුවේ කොටසක් නොවේ. එය හතරවන ආණ්ඩුව යැයි කියන වෙනම ආණ්ඩුව කි.

නමුත් අද මෙම අයිතිය ජනමාධ්‍ය කෙරෙන් පැහැර ගනිමින් තිබෙන්නේ ආණ්ඩුව ත්‍රස්තවාදය පරදවන තුරු ජනමාධ්‍ය පාක්ෂික විය යුතුය යන තර්කය යටතේ ය. එසේ නම් ජනමාධ්‍ය එසේ හැසිරිය යුතුව තිබුණේ 1981 සිට ය. දේශපාලඥයින් ද හැසිරිය යුතුව තිබුනේ එසෙ"ය. නමුත් අද මේ තර්ක ඉදිරිපත් කරන කිසිවකු විපක්ෂයේ සිට එලෙස තර්ක කලේ නැත. මානව හිමිකම් සහ මාධ්‍ය නිදහස අවශ්‍ය බවට උද්ඝෝෂනයේ යෙදුනා පමණක් නොව ජිනීවාහි මානව හිමිකම් කොමිසමට ද එම වාර්තා මිටි පිටින් රැගෙන ගියහ. ආරක්ෂ හමුදා පතුරු ගැසූහ.

ඉන් ගම්‍ය වන්නේ මෙම සියළු තර්ක විතර්ක ඉදිරිපත් වන්නේ ප්‍රතිපත්තියක් ලෙස නොව අවස්තාවට අනුව බව ය. බලයේ සිටින විට දේශපාලනඥයින් කියන කතා සම්පූර්ණ සත්‍ය ලෙස අප පිළිගත යුතු නම් විපක්ෂ දේශපාලන පක්ෂ සහ ආණ්ඩුවෙන් ස්වාධින ජනමාධ්‍ය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් අවශ්‍ය නැත.

සුනන්ද දේශප්‍රිය